# අංගුලිමාල සූත්‍රය :

## අංගුලිමාල හිමියන්ගේ විමුක්ති සාධනය සහ තදාශ්‍රිත දාර්ශනික හා ආගමික සංකල්පයන්හි විචිත්‍රත්වය

*- රළුවේ පද්මසිරි හිමි -*

මෙම ලිපිය මූලික අදියර තුනක් යටතේ සංවිධානය වී ඇත.

01. අංගුලිමාල පුවත පිළිබඳ සූත්‍රපිටකාගත හා අටුවා වාර්තාකරණය
02. සූත්‍ර පිටක අන්තර්ගතයේ ඓතිහාසිකත්වය ඇසුරෙන් පැන නැගී ඇතැම් ගැටළු
03. එම සූත්‍රයෙහි ප්‍රකට දාර්ශනික සහ ආගමික විශ්ලේෂණයන්හි සුවිශේෂත්වය

මෙම අදියර තුන අධ්‍යයනය කෙරෙන්නේ පහත සඳහන් ක්‍රමවේද හරහායි.

01. අංගුලිමාල පිළිබඳ විස්තර වාර්තාවන මූලාශ්‍ර හා ඒවායේ අන්තර්ගතය ඉදිරිපත් කෙරේ.
02. තද් සූත්‍රයෙන් පැන නැගි විවිධ ගැටළු අතර එක් ගැටළුවක් විසඳාලීමට විද්වතුන් ගත් උත්සාහය සහ එහි සංකීර්ණත්වය පිළිබඳ විවරණයක් සැපයේ
03. මුල් සූත්‍ර හා අටුවා තුළින් ප්‍රකට අංගුලිමාල චරිතය සහ ඔහු විමුක්ති සාධනය කිරීම පිළිබඳ ඉදිරිපත් ව ඇති විශ්ලේෂණයන්හි මනහර බව සහ සුවිශේෂි විප්ලවීය බව විමර්ශනාත්මකව ඉදිරිපත් කෙරේ.

## 01. අංගුලිමාල පුවත සූත්‍ර හා අට්ඨකථා ආශ්‍රයෙන්

බෞද්ධයන් අතර අතිශය ජනාදරයට හා ජනප්‍රියත්වයට පත් චරිත අතර සුවිශේෂී චරිතයක් ලෙස අංගුලිමාල තෙරුන් හඳුනා ගත හැක. බොහෝවිට ජන සමාජය සමග සංස්කෘතිකව හා පූජා චාරිත්‍රමය අගයන් සහිතව බද්ධ වූත් බෞද්ධයන් ගෞරවය භක්තිය සහිතව පිළිගනු ලබන්නා වූත් සූත්‍රයක් ලෙස අංගුලිමාල සූත්‍රය නිර්වචනය කිරීම සාධාරණය.

අංගුලිමාල චරිතය පිළිබඳ සූත්‍ර පිටකයේ ස්ථාන දෙකක වාර්තා වෙයි. ඉන් පළමු වැන්න වන්නේ මජ්ඣිම නිකායේ මජ්ඣිම පණ්ණාසකයට අයත් අංගුලිමාල සූත්‍රයයි. දෙවැන්න වන්නේ ථේරගාථා පාලියේ එන අංගුලිමාල ථේරගාථාවයි. අංගුලිමාල සූත්‍රය ආශ්‍රිත විවරණයක් බුද්ධඝෝෂ හිමියන් විසින් රචිත යයි සැලකෙන ම.නි. අටුවාව වන පපංචසූදනීය (පසූ) හා ථේරගාථා අට්ඨකථාව වන ධම්මපාල හිමියන් විසින් රචිත පරමත්ථදීපනිය (පදී) තුළ අංගුලිමාල ථේරගාථාව පිළිබඳ විස්තරත් ඇතුළත් වෙයි.

අඟුල්මල් පුවත ලාංකේය සමාජයට නුහුරු වූවක් නොවන නමුත් සූත්‍රානුසාරයෙන් ඉදිරිපත් වන අංගුලිමාල චරිතය හා සංස්කෘතිකව පිළිගත් අංගුලිමාල චරිතය අතර යම් යම් පරස්පරතා ප්‍රකට වන හෙයින් (අඟුල්මල් චරිත කථාව පිළිබඳ) සූත්‍රානුගත අඟුල්මල් චරිතය මෙහි දී සාරාංශව ඉදිරිපත් කෙරේ.

### (අ) අංගුලිමාල සූත්‍ර සාරය

සැවැත් නුවර දෙව්රම් වෙහෙර බුදුරදුන් වැඩසිටින කල කොසොල් රජු මුහුණ දුන් අංගුලිමාල නම් භයානක සොරකු හා මනුෂ්‍ය ඝාතකයකු පිළිබඳ විස්තරයකින් මෙම සූත්‍රය ඇරඹේ. මේ පිළිබඳ දත්



බුදුරදහු අංගුලිමාල හමුවීමට තීරණය කොට ඔහු සිටින වනාන්තරය දෙසට ගමන් අරඹති. මේ දකින විවිධ සමාජ පිරිස් අංගුල්මල්ගේ භායනකත්වය විස්තර කරමින් බුදුරදුන් එම ගමනින් වළක්වන්නට උත්සුක වෙයි. එම දැනුවත් කිරීම්, ඉල්ලීම් නොතකා බුදුරදුන් අඟුල්මල් සිටි වනාන්තරයට වැඩම කරනු ලබයි.[1]

තම වන දහනට බුදුරදුන්ගේ පැමිණීම දුටු අඟුල්මල් පුදුමයට පත්වන්නේ පිරිස් සහිතවත් මිනිසුන් නොපැමිණෙන මෙම වනයට මෙම ශ්‍රමණයා කුමක් හෙයින් තනිව පැමිණියේ ද යන කරුණ පිළිබඳවයි. බුදුන් දුටු වහාම අඟුල්මල් එතුමන්ව ඝාතනය කිරීමට තීරණය කොට එතුමන් පසුපස ලුහුබඳියි. මෙහිදී බුදුරදුන් අධිෂ්ඨානයක් කරයි. තමන් වැඩසිටින බවත් අඟුල්මල් සීඝ්‍රයෙන් ගමන් කළත් උන්වහන්සේ අල්වාගත නොහැකිවන සේත් අංගුලිමාලට පෙනීමට සලස්වයි. බුදුරදුන්ට සමීපවීමට උත්සාහ ගෙන එය ව්‍යර්ථ වූ පසු ඉතා ජනප්‍රිය වූ මෙම ප්‍රකාශය ඔහුගේ මුවින් ප්‍රකාශ වෙයි.

'මහණ, සිටුව, මහණ සිටුව!'

බුදුරදුනගේ පිළිතුර වූයේ

'මම සිටියෙමි ඔබත් සිටින්න![2]' යන්නයි.

මෙම පිළිතුරත් සමග අඟුල්මල්ගේ සිත මදක් කලබලකාරි ගතියෙන් මිදී වෙනතකට යොමුවෙයි. සූත්‍රයට අනුව අඟුල්මල් මෙසේ කල්පනා කරයි. සත්‍යවාදී වූ සත්‍ය ප්‍රතිඥා දී ඇති සාක්‍ය පුත්‍රයන් වහන්සේ මෙවන් ප්‍රකාශයක් කරන්නේ ඇයි? ඔහු ගමන් කරමින්ම

[1] ඒවං වුත්තේ භගවා තුණ්හීභූතෝ අගමාසි, ම.නි. ෂෂ: 516

[2] තිට්ඨ සමණා, තිට්ඨ සමණාති. ඨිතෝ අහං අංගුලිමාල, ත්‍වංච තිට්ඨාසීති. ම.නි. II: 516

නැවතී සිටින බව ප්‍රකාශ කරයි.[3] මෙහි අර්ථය කුමක්දැයි විමසා දත යුතු යයි සිතන ඔහු බුදුරදුන්ගෙන් ඒ බව විමසයි. බුදුරදුන් ඊට මෙලෙස පිළිතුරු දෙයි.

'අඟුලිමාලයෙනි මම සැමදා සත්ත්වයින්ට හිංසා පීඩා නොකොට දඬු බැහැර තබා සිටිමි. නුඹ සත්ත්වයින්ට හිංසාකාරිය. එබැවින් මම සිටියේ වෙමි. නුඹ නොසිටියෙහිය.[4]

මෙය ඇසූ අඟුල්මල් අවි ආයුධ බිම හෙළා තමන්ව පැවිදි කරන ලෙස ඉල්ලා සිටියෙන් බුදුහු ඔහුට ප්‍රව්‍රජ්‍යාව ලබා දෙති.

නවක ප්‍රව්‍රජිත අඟුල්මල් තෙරුන් සමග දෙව්රම් වෙහෙරට වැඩම කරන බුදුරදුන් එහි වැඩවසන අතරතුර පසේනදී කොසොල් රජු විහාරයට පැමිණෙයි. ඔහුගේ මුහුණෙහි කෝපාන්විත ඉරියව් දැක ඊට හේතු විමසූ විට රජුගේ පිළිතුර වූයේ අංගුලිමාල නම් දරුණු පුද්ගලයා නිසා ජනතාව වීදි බැස ඇති බවත් ඔහුව අල්ලා ගැනීමට තමන් සේනාව සමග ඔහු සිටින වනයට ගමන් කරන බවත්ය.

එම භයානක පුද්ගලයා ප්‍රව්‍රජිතයෙකු වුවහොත් ඔහුට කෙසේ සලකන්නේදැයි බුදුරදුන් රජුටගෙන් විමසයි. රජුගේ පිළිතුර වන්නේ එසේ වුවහොත් අවශ්‍ය ගෞරව සහ සත්කාරත් ප්‍රත්‍ය පහසුකනුත් ලබා දෙන බවයි. ඉක්බිති බුදුහු රජුට අඟුල්මල් තෙරහු පෙනෙන්නට සලස්වති. ඒ දුටු රජු පළමුව යම් ලොමු දැහැගැනීමකට ලක් වූ අතර බුදුරදුන් රජුව අස්වසාලයි. ඉක්බිති අඟුල්මල් හිමියන්ට තුන් සිවුරු සහ ප්‍රත්‍ය සපයාදීමට රජු සූදානම් වූ විට ඒ සියල්ල සම්පූර්ණ බව ඒ හිමි ප්‍රකාශ කරයි.

---

[3] මේ ප්‍රකාශය සත්‍ය නම් අංගුලිමාල බුදුරදුන්ව පෙර සිට දැනහඳුනා සිටිය යුතුය.

[4] තුවඤ්ච පාණේසු අසඤ්ඤතෝසි - තස්මා ඨිතෝහං තුවමට්ඨිතෝසි ම.නි. II: 518



පසු දිනෙක පිඬුසිඟා වඩින අඟුල්මල් තෙරුන් ප්‍රසූති වේදනාවෙන් පීඩා විඳින ගැබිණි මවකගේ අපහසුතාවට සවන් දී ඒ බව බුදුරදුන්ට පවසයි.[5] එසේ නම් එම ගැබිණියට හා දරුගැබට අනුකම්පාවෙන් සෙත් පිණිස සත්‍යක්‍රියාවක් කරන ලෙස බුදුරදහු අඟුල්මල් තෙරුනට උපදෙස් දෙති. එම සත්‍යක්‍රියාව මෙසේ විය ය යුතු බවද උන්වහන්සේ වදාරති.

'නැගණියනි, මම උපන් දා පටන් දැන දැන සතෙකුගේ දිවි තොර කළ බව නොදනිමි. එම සත්‍යයෙන් ඔබට සෙත් වේවා!
ඔබගේ ගැබට සෙත් වේවා!
(ම.නි. II, 525)

මෙහිදී අඟුල්මල් තෙරුන්ගේ පිළිතුර වන්නේ ඉහත සත්‍ය ක්‍රියාව සිදුකිරීමට තමන් අසමත් බවයි. තමන් දැන දැන ම බොහෝ මිනිසුන්ගේ (සත්ත්වයින්ගේ) දිවි තොර කළ බැවින් එම සත්‍යක්‍රියාව නොකළ හැකි යයි පවසයි.[6] එවිට බුදුරදුන් සත්‍යක්‍රියාවේ අන්තර්ගතයේ සුළු වෙනසක් කොට එමගින් සත්‍යක්‍රියා කරන සේ පෙන්වා දෙයි.

'මම යම් දිනක ආර්‍ය්‍ය ජාතියෙහි උපන්නේ ද එදින සිට දැන දැන සතකුගේ දිවි තොර නොකළෙමි........' (ම.නි. II, 525)

අංගුලිමාල තෙරණුවෝ එම කාන්තාව වෙත ගොස් සත්‍යක්‍රියාව සිදුකරති. එම කාන්තාවත්, දරුවාත් එමගින් සෙත සලසා ගත් බව ද සටහන් වෙයි.

---

[5] මෙය බුදුරදුන් යෙදූ උපක්‍රමයක්ද විය හැකිය. අඟුල්මල් තෙරුන්ගේ සිහිකැඳවීම සඳහාත්, තමාගේ වරද වරදක් බව වටහා ගැනීම සඳහා අඟුල්මල් තෙරුන්ව පොළඹවන අවස්ථාවක් ලෙසත් මෙම සිදුවීම හඳුනාගත හැකිය

[6] සෝහි නූන මේ භන්තේ, සම්පජාන මුසාවාදෝ භවිස්සති, මයා හී භන්තෙ, බහු සඤ්චිච්ච පාණං ජීවිතා වෝරෝපි තානි. ම.නි. II: 524

මීළඟට වැදගත් සිදුවීම වන්නේ එතුමන් රහත් භාවයට පත්වීමයි. අවශ්‍ය පිළිවෙත්, බ්‍රහ්ම චර්යාව සම්පූර්ණ කොට එතුමන් විමුක්තිය සාක්ෂාත් කරයි.[7]

අඟුල්මල් රහතන් වහන්සේ අනපේක්ෂිත හිංසා පීඩා රැසකට මුහුණදීම සිදුවන්නේ මින් අනතුරුවයි. එතුමන් පිඬුසිඟා වඩින විට ඉවතට විසි කරන ලද ගල්, මුගුරු, දඬු එතුමන්ගේ හිසෙහි, සිරුරෙහි, පාත්‍රයෙහි, චීවරයෙහි ගැටුණු බවත් ලේ ගලනා හිසින් බුදුරදුන් හමුවට පැමිණි බවත් තවදුරටත් දැක්වේ. මේ අපහසුතාව දුටු බුදුරදුන් ඔහුව අස්වසන්නේ මෙලෙස පවසමිනි.

> 'බමුණ, ඉවසන්න......... යම් යම් කර්ම විපාක
> බොහෝ වර්ෂ ගණනක්, වසර සිය ගණනක්, දහස්
> ගණනක්, විඳිය යුතු ද නුඹ ඒ කර්ම මේ ආත්මයේදීම
> (භවයේ දී) විඳිහි'
> (ම.නි. II, 525)

ඉනික්බිති විග්‍රහ වන්නේ අඟුල්මල් මහරහතුන්ගේ උදාන වාක්‍යයයි. එහිදී එතුමන්ගේ ගෘහ දිවිය පිළිබඳ තොරතුරුත් තම පරිවර්තනය පිළිබඳවත් එම පරිවර්තනය නිසා ලද තෘප්තියත්, ප්‍රකාශ කරන අතර, ඇතැම් ධර්ම කරුණු පිළිබඳ ගැඹුරු සාරාංශයකුත් අවසානයේ දී දක්නට ලැබේ.

7 'අථ බො අයස්මා...... ඒකෝ වූපකට්ඨෝ අප්පමත්තෝ ආතාපී පහිතත්තෝ න චිරස්සේව ..... තදනුත්තරං බ්‍රහ්මචාරියං පරියෝසානං දිට්ඨෙව ධම්මේ සයං අභිඤ්ඤා සච්චිකත්වා උපසම්පජ්ජ විහාසි. ඛීණා ජාති, වූසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති අබ්භඤ්ඤාසි'
(ම.නි. II: 524)



**(ආ) අංගුලිමාල චරිතය පිළිබඳ අට්ඨකථා විවරණය :**

අඟුල්මල්ගේ ගෘහ හා පැවිදි දිවිය පිළිබඳ ඇතැම් තතු සූත්‍රය හා අටුවා තුළ දි වෙනස්කම් සහිතව විස්තර වෙයි. ලාංකේය සංස්කෘතිය තුළ පිළිගනු ලබන, මුඛ පරම්පරාවෙන්, සමාජගත වී ඇති අංගුලිමාල කතා ප්‍රවෘත්තිය බොහෝ විට අටුවා ආශ්‍රයෙන් සකස් කර ගත්තකි. එසේ වූවත් පපංචසූදනී (පසූ) හා පරමත්ථදීපනී (පදී) හීදී මේ පිළිබඳ දැක්වෙන විස්තර ද එක සමාන නොවේ. එසේ ප්‍රකට වන ඇතැම් වෙනස්කම් ඉතා සරල වූවත් ඇතැම් ඒවා සංකීර්ණ වෙනස්කම් ලෙස වටහා ගත හැකිය. එබැවින් එම කෘතිවල සඳහන් එවන් වෙනස්කම් සහිත විවිරණ කිහිපයක් මෙහිදී උපුටා දක්වන්නේ ඒ පිළිබඳ තීරණ ගැනීමට පාඨකයා හට ද ඉඩක් තැබීමේ අදහසිනි.

පපංචසූදනී (පසූ) : ඉක්බිති ඔහු (අඟුල්මල්) වනය මැද දී හෝ එහි ප්‍රවේශයේ දී හෝ වනයෙන් පිටත් වන ස්ථානයෙහි දී මිනිසුන් මැරීය. ඔහු ඔවුන්ගේ කිසිදු ඇඳුමක් පැහැර නොගත් අතර ඔවුන්ගේ ප්‍රමාණය ගණනය කළේය. එහෙත් ඔහුගේ ගණනය කිරීම වැරදී ගියේය. ඉක්බිති ඔහු ඔවුන් එකිනෙකාගේ ඇඟිල්ලක් කපාගත්තේය. එහෙත් ඇඟිලි අතුරුදහන් වන්නට පටන්ගත් බැවින් ඒවා සිදුරු කොට ඒවායින් මාලයක් සකස් කර ගත්තේය. මේ නිසා ඔහු අංගුලිමාල නම් විය.

පරමත්ථදීපනී (පදී): ඔහු වනය මැදින් ගමන් කරන්නවුන් පෙනෙන පරිදි කඳු මුදුනක ජීවත්විය. මිනිසුන් ගමන් කරන මාවතට පත් හෙතෙම ඔවුන්ගේ ඇඟිලි ගෙන ඒවා ගසක එල්ලා තැබීය. ගිජුලිහිණින්

02 MAY 2012

සහ කපුටන් ඒවායින් ඇතැම් කොටස් කා දැමූ අතර තවත් ඒවා බිම වැටුණි. තවත් සමහර ඇඟිලි කුණු වුණි. එනිසා නිවැරදිව ගණනය කිරීම් සිදු නොකළ හැකි විය. ඔහු හුයක් ගෙන ඇඟිලි ගැටගසා ඉන් මාලයක් තනාගෙන යාග හූයක් (සඤ්ඤෝ පවිතං) සකස්කොට එය පැළඳ ගත්තේය. එසේ හෙයින් ඔහු අංගුලිමාල නම් වුණි.

**පසු** : කිසිවෙකුහට වනයට ඇතුල් නොවිය හැකි විණි. ගොදුරු සොයමින් රාත්‍රියේ දී ගම්වලට පිවිසි අඟුල්මල් දොරවල් කඩා නිඳි පැදුරේදීම මිනිසුන් මරා දැමීය. මේ නිසා මිනිසුන් ගමෙන් නගරයටත් නගරයෙන් මහා නගරවලටත් පළා ගිය අතර, යොදුන් තුනක් යන තෙක් ගම්බිම් හැරදමා අවසානයේ දී සැවැත් නුවරට පැමිණි ඔවුහු රජ මාළිගය වටා රොක් වී රජුට මේ පිළිබඳව පැමිණිලි කළහ.

**පදී** : මිනිසුන් (වනාන්තරය මැදින්) ගමන් කරන කල්හි ගම්වලදී අංගුලිමාල මිනිසුන්ව මරා දැමීය. කල් යාමේදී සියලු මිනිස්සු ගම් හැර ගියහ. මේ වන විට ඇඟිලි දහස සම්පූර්ණ කිරීමට අඟුල්මල්ට අවශ්‍ය වූයේ තවත් එක් ඇඟිලක් පමණි. මේ පිළිබඳව මිනිසුන් කොසොල් රජුට පැමිණිලි කළෙන් රජු සිය සේනාව සමග ගොස් ඔහුව අල්ලා ගන්නා බව ප්‍රකාශ කළේය.



**පස** : අංගුලිමාල තම පුත් අහිංසක බව වටහාගත් පිය බමුණා ඒ බව සිය බිරිඳට ප්‍රකාශ කළේය. තම පුත් නිවසට රැගෙන එන ලෙස බැමිණිය සිය සැමියාගෙන් ඉල්ලා සිටිය ද තමන් ඊට උත්සාහ නොකරන බව ඔහු ප්‍රකාශ කළෙන් ඇය තම පුතු ආරක්ෂා කොට කැටුව ඒමට (වනයට) ගමන් කළාය. උදෑසන දිවැසින් ලොව බැලූ බුදුරදුන් දුටුවේ තමන් එහි වැඩියහොත් එක් ගාථා ධර්මයක් ශ්‍රවණයෙන් ම අංගුලිමාල ධර්මාවබෝධය ලබන බවත් අංගුලිමාලව නිදහස් කරගත හැකි බවත්ය. තමන් එහි නොවැඩියහොත් සිය මව මරා අඟුල්මල් ආනන්තරිය පාප කර්මයක් සිදුකරගන්නා බවත් එසේ වුවහොත් ඔහු නිදහස් කරගත නොහැකි බවත් බුදුහු දුටහ. එසේ හෙයින් අඟුල්මල්ට උපකාර කිරීමට ඉටාගත් බුදුහු අහර කිස නිම කොට එහි යාමට පිටත් වූහ.

**පදී** : රජුගේ අණ පිළිබඳව දත් (අඟුල්මල්ගේ) මෑණියන් සැමියාට ප්‍රකාශ කළේ වනයට ගොස් තම පුතු නිවැරදි කරවා නිවසට කැටුව එන ලෙසත් එසේ නොවුවහොත් රජු විසින් ඔහුව නසනු ඇති බවත් ය. පියාගේ පිළිතුර වූයේ එවැනි පුතෙකු තමන්ට අනවශ්‍ය බවත් රජු කැමති පරිදි අඟුල්මල්ට එරෙහිව ක්‍රියා කරනු ඇති බවත්ය. අන්තිම ආත්ම භවයෙහි දී අංගුලිමාල සතු සක්‍යතා වටහාගත් බුදුරදුන් සිතුවේ අංගුලිමාල සිය මෑණියන්ව හමු

02 MAY 2012

වුවහොත් දහස්වෙනි ඇඟිල්ල සපයා ගැනීමට මව ඝාතනය කරනු ඇති බවයි. ඒ නිසා ඒ බව දැනගෙන අහර කිස නිම වූ බුදුහු වනය කරා පා ගමනින්ම වැඩම කළ සේක.

පසු : අංගුලිමාල මේ වන විට තමන්ගේ අසම්පූර්ණ වූ ජීවන තත්ත්වය කෙරෙහි කලකිරී සිටි අතර මිනිසුන් 999 ක් මරා තිබුණි. තමන්ට තවත් අවශ්‍ය එක් ඇඟිල්ලක් පමණක් බව දත් ඔහු මීළඟට හමු වන පුද්ගලයා නැසීමට තීරණය කළේය. එවිට සිය ගුරු පූජාව අවසන් කොට රැවුල බා, නා පිරිසිදු වී, ඇඳුම් මාරු කරගෙන දෙමාපියන් හමුවීමට යා හැකි වෙතැයි ඔහු සිතීය. වනයේ මැද සිට එහි කෙළවරට පැමිණ සිටි ඔහු එහි පැමිණ සිටි බුදුරදුන්ව දුටුවේය.

පදී : බුදුරදුන් ද වනයට පැමිණ සිටිය දී තම මෑණියන් දුරදීම දුටු අංගුලිමාල 'අද මම මගේ මව ඝාතනය කොට අඩුවී ඇති එකම ඇඟිල්ල සම්පූර්ණ කරගනිමි' යි සිතීය. සිය කඩුව ඇදගත් ඔහු මව පසුපස දුවන්නට විය. බුදුරදුන් ඔවුන් දෙදෙනා අතරට මැදිහත් විය. බුදුන් දුටු අඟුල්මල් මෙසේ සිතීය. 'ඇයි මා ඒ ඇඟිල්ල සඳහා මව ඝාතනය කරන්නේ? ඇය ජීවත් ව සිටිය දී මෙම ශ්‍රමණයාව නසා ඔහුගේ ඇඟිල්ල (කපා) ගනිමි' යි කඩුව ගෙන බුදුරදුන් පසුපස ලුහුබඳින්නට වුණි.[8]

[8] මෙම කොටස් මවිසින් පරිවර්තනය කරන ලදී.



පපංචසූදනීයේ සහ පරමත්ථදීපනියේ අංගුලිමාල පිළිබඳ ඉහත දක්වන ලද විග්‍රහය බොහෝ විට සමාන ලක්ෂණවලින් සමන්විත වුවත් එකිනෙකට පරස්පර කරුණු ද ඒ තුළ ප්‍රකට වේ. ධම්මපාල හිමියන් බුදුගොස් හිමියන්ගේ තොරතුරු අනුකරණය කිරීම හෝ ස්වකීය භාෂාවෙන් වාර්තා කිරීම පමණක් පරමත්ථදීපනියේ සිදු කර ඇති බවට ඇති අදහස පහසුවෙන් බැහැර කිරීම ද නොකළ හැකිය. මෙම වාර්තා දෙකෙහිම අර්ථ එකිනෙකට සමීපව ඇති බව ප්‍රකට හෙයින් මෙම ග්‍රන්ථ දෙකටම මූලාශ්‍ර වූ පොදු පුරාවෘත්තයන් තිබෙන්නට ඇති බව අනුමාන කළ හැකිය. බුදුගොස් හිමියන්ගේ අටුවාවන්හි සඳහන් බොහෝ ප්‍රවෘත්ති අයත් වන්නේ ද මෙතෙක් කලක් තිස්සේ පැවත ආ පුරාවෘත්තවලට බව නොරහසකි. එම නිසා එවැනි පොදු පුරාවෘත්තයක් මේ දෙකටම මූලාශ්‍ර වන්නට ඇතැයි ගොම්බ්‍රිච්[9] අදහස් කරයි.

අංගුලිමාල මෙතරම් ක්‍රෑර පුද්ගලයෙක් වූයේ කුමක් නිසාද යන කරුණට ගැලපෙන ඓතිහාසික ප්‍රවෘත්තියක් මේ තුළ දක්නට ලැබේ. එසේ වුවත් දක්ෂ ශිෂ්‍යයෙකු සේ සඳහන් ශිෂ්‍යයෙකු මෙතරම් දරුණු වූයේ කුමන සාධක පදනම් කොට ගෙන ද යන්නට ප්‍රමාණවත් හේතු සාධක මෙම ප්‍රවෘත්තිය තුළ සටහන් නොවේ. එසේ දරුණු වීමට හේතු වූ කරුණු පිළිබඳ ප්‍රමාණවත් එකඟතාවක් සූත්‍රය තුළ හා අටුවාව තුළ ද අප්‍රකටය. සූත්‍රය තුළදී ඔහුගේ නම අංගුලිමාල වූ බවත් අහිංසක වූ බවත් සඳහන් වේ. ධම්මපාල හිමියන්ගේ අර්ථකථනයට අනුව අඟුල්මල්ගේ ආචාර්යවරයා ඔහුගෙන් ඉල්ලා ඇත්තේ ඇඟිලි දහසකි. මිනිසුන් දහසක් ඝාතනය කිරීමේ අවශ්‍යතාවක් එමගින් ප්‍රකටවම ප්‍රකාශ නොවේ. මේ හා සම්බන්ධවම මතුවන ගැටළු රාශියකි. අංගුලිමාල එක් පුද්ගලයෙකුගෙන් ලබාගත් ඇඟිලි සංඛ්‍යාව කොපමණද? එකක් ද? දෙකක්ද? එසේ නැතහොත් ඇඟිලි දහයක්ද? යන කරුණු පිළිබඳ එකඟතාවක් නොමැත. ඇඟිලි කපා ගැනීමට මිනිසුන් ඝාතනය කිරීම අත්‍යවශ්‍ය ද යන්න තවත් ගැටළුවකි. මෙවැනි ගැටළු මතු කිරීමෙන්

[9] Gombrich, 1997:137

අපේක්ෂා කරන්නේ අංගුලිමාල කතා පුවත නිෂ්ප්‍රභ කිරීමේ ප්‍රයත්නයක් නොවේ. එසේ නමුත් ඒ පුවත සටහන් වන මූලාශ්‍ර අතරවත් යම් ඒකඟතාවක් ප්‍රකට වේ නම් හෝ එවන් ඒකඟතාවකට කරුණු සකස්කොට පැමිණිය හැකි නම් සත්‍ය ප්‍රවෘත්තියේ අගය තවත් වර්ධනය වීමට එය හේතුවනු නිසැකය.

## 02. සූත්‍රානුගත අන්තර්ගතයෙහි ඇතැම් කරුණුවල ඓතිහාසිකත්වය පිළිබඳ ගැටළු

මෙහිදී අපගේ අරමුණ වන්නේ අංගුලිමාල සූත්‍රයේ සහ අංගුලිමාල ථේරගාථාවන්හි ප්‍රකට කරුණුවල යම් යම් ගැටළුකාරී තත්ත්ව පවතී ද? පවතී නම් ඒවා මොනවාද යන්න පිළිබඳ විමසීමක් කිරීමයි. මෙවන් කරුණක් අවධාරණය කිරීම අවශ්‍ය වන්නේ සූත්‍රයේ ඓතිහාසිකත්වය සේම එහි ධර්ම කරුණු ද කෙතරම් වෙනස්කම්වලට කාලීනව පරිවර්තනය වී තිබේද යන්න පිළිබඳ වැටහීමක් ලබා ගැනීම සඳහායි. එවන් පරිවර්තනමය හා පරිණාමීය ලක්ෂණ දක්නට ලැබෙන්නේ නම් සූත්‍රය පිළිබඳ විවිධ දෘෂ්ටිකෝණවලින් අධ්‍යයනය කිරීම අවශ්‍ය වන බව අපට පැහැදිලියි. ඉහත මූලාශ්‍රද්වයෙහි ප්‍රකට එවන් එක් ගැටළුකාරි අවස්ථාවන් රිචඩ් ගොම්බ්‍රිච් විසින් සිය කෘතියකදී[10] 'Who was Angulimala?' යන ලිපියේදී මතු කොට දක්වා එය විසඳීමට යම් ප්‍රයත්නයක් ද ගනියි. ඒ නිසා මෙම ගැටළුව සාකච්ඡා කිරීමේදී එම කරුණම සංක්ෂිප්තව සාකච්ඡා කෙරේ.

මෙම මූලාශ්‍ර දෙකෙහිම ප්‍රකට වන එක් ගාථාවක් තුළින් පැන නැගෙන ගැටළු කිහිපයක් මෙහිදී සාකච්ඡා කෙරේ. එම ගාථාවෙහි අර්ථයට අනුව අංගුලිමාල මෙම හමුවීමට පෙර බුදුරදුන්ව මුණගැසී ඇති බවට ප්‍රකට වේ. අඟුල්මල්ට 'නවතින' ලෙස බුදුරදුන් උපදෙස් දුන් පසු අංගුලිමාලගේ පිළිතුර ලෙස මෙම ගාථාව බව සටහන් වේ. මෙම

[10] Gombrich, 1997:



ගාථාවෙහි සාමාන්‍ය අර්ථය සත්‍ය සේ පිළිගතහොත් අටුවාවෙහි ද දැක්වෙන පරිදි අංගුලිමාල බුදුරදුන්ව මනාව හඳුනාගත් බව පිළිගන්නට අපට සිදුවෙයි. එහෙත් එවන් සැබෑ හඳුනාගැනීමක් බුදුන් පිළිබඳ තිබුණේ නම් උන්වහන්සේව ඝාතනය කිරීමට ඔහු ලුහුබඳී ද යනු මෙහිදී මතුවන ප්‍රබල ගැටළුවකි. එම ගාථාව සහ එහි අර්ථය පළමුව දක්වා ඉන් ඉක්බිති මෙහි විවිධ පරිවර්තන ඉදිරිපත් වී ඇති ආකාරයත් ගැටළුව නිරාකරණය එමගින් කිරීමට ලබාගත හැකි සහයෝගයත් විමසා බැලේ.

*චිරස්සං වත මේ මහිතො මහේසී*
*මහාවනං සමණෝයං පච්චුපාදී*
*සොහං චිරස්සාපි පහස්සං පාපං*
*සුත්වාන ගාථා තව ධම්මසුත්තං* (ම.නි. II, 518)

"දෙව් මිනිසුන් විසින් පූජිත මේ මහාර්ෂි මහණ බොහෝ කල් ඇවෑමෙන් (බොහෝ කලකට පසු) මට වැඩ සඳහා මහවනයට වැඩියේ ය. මම තොපගේ ධර්ම යුක්ත ගාථා අසා කල් ඇවෑමෙනුදු පව් හරනෙමි." (ම.නි. II, 518)

මෙහිදී ගැටළුව උද්ගත වී ඇති පද ලෙස හඳුනාගන්නේ 'චිරස්සං' යනු 'බොහෝ කල් ඇවෑමෙන්' වන අතර 'මහේසී' යනු 'මහාර්ෂී මහණ' යන අරුත ගනී.

විවිධ කර්තෘවරුන්, පරිවර්තකයන්, විද්වතුන් මීට දී ඇති අර්ථකථන අසමානය. එසේම බුරුම, සියම් සහ සිංහල සම්ප්‍රදායයන් එම ගාථාව සටහන් කිරීමේ දී ගැටළුව තවත් සංකීර්ණ කරයි. මේ සියල්ල පිළිබඳ අධ්‍යයනයකින් පසුව ගොම්බ්‍රිච්ගේ නිගමනය වී ඇත්තේ මෙම පාඨය විවිධ විපර්යාසවලට කාලීනව ලක්වී ඇති බවයි. (ගොම්බ්‍රිච්, 1995:144). බුරුම වාර්තාවන් හි 'මහාවනං පාපුණි, සංච්චවාදී' සේත් තායිලන්ත මුද්‍රිත සංස්කරණ අනුව 'මහාවනං සමණ පච්චවාදී' ලෙසත්

සිංහල සම්ප්‍රදාය ඉහත දැක්වූ පරිදි 'මහාවනං සමණෝයං පච්චුපාදී' ලෙසින් ය. මෙම ගාථාව පරිවර්තනය කර ඇති ආකාර කිහිපයක් මෙහිදී හඳුනා ගනිමු.

**කේ.ආර්. නොර්මන්, (1969:82)**

"මගේ ගෞරවයට පත් වූ පූජිත වූ මහර්ෂී වූ ශ්‍රමණයෙකු මහවනයට වැඩියේ බොහෝ කලකිනි. ඔබේ සත්‍ය වූ ගාථා අසා මම මාගේ විවිධ පාප ක්‍රියාවන්ගෙන් බැහැර වෙමි."

අංගුලිමාල මෙහිදී සඳහන් කරන ශ්‍රමණය කවුරුන්ද? ඔහුගේ ලක්ෂණ මොනවාද? සැබවින්ම අංගුලිමාල මීට පෙර බුදුරදුන් හමු වූ බවක් සූත්‍රයෙහි හෝ අටුවාවෙහි සඳහන් නොවේ. එසේ නම් අඟුල්මල් මීට පෙර සිට හඳුනාගෙන සිටි වෙනත් ශ්‍රමණයෙකු පිළිබඳ මෙමගින් අදහස් වේද? යන්න මෙහිදී විසඳාගත යුතුය.

**පූජ්‍ය ඥානමෝලි හිමි (ම.නි. 195)**

"මවිසින් ශ්‍රමණයකු පුදනු ලැබුවේ බෙහෝ කලකිනි. මෙම ශ්‍රමණයා, දැන් මේ මහා වනයේ පෙනී සිටියි; සැබැවින්ම සියලුම අකුසල් හැර දමමි; ධර්මය පෙන්වා දෙමින් සිදුකළ ඔබේ දේශනය අසා."

ගොම්බ්‍රිච්ගේ අදහස (1997:146) ඉහත පරිවර්තන දෙකට අනුව ගම්‍ය වන්නේ අංගුලිමාල බුදුරදුන් හමුවීමට පෙර එතුමන්ට ගෞරව කළ බවයි. එහෙත් සූත්‍රය හෝ වෙනත් මූල් මූලාශ්‍ර තුළ එවන් සටහනක් ප්‍රකට නොවේ.



**කර්ට් ස්චමිඩ්ට් (Kurt Schmidt, 1989:229)**

"දිගු කලකට පෙර අතිශයින් ගෞරවයට පත්, ප්‍රඥාවන්ත පුද්ගලයා මා වෙත පැමිණියේය. (මම ඔහුට කීමි): ඔබේ සත්‍ය වචන මා හට දැනගත හැකි වී නම් (ලැබුණි නම්) බොහෝ කලකට ඉහත දී මගේ පාප ක්‍රියා බැහැර කරන්නට තිබුණි."

'පහාස්සං' යන පදය ඔහු පරිවර්තනය කරන්නේ 'මවිසින් අත්හැර දමනු ඇත' යනුවෙනි. එසේ වුවත් 'චිරස්සං' යන්න දෙවරක් යොදාගෙන ඇති නිසා පරිවර්තනයේ නිරවද්‍යභාවයට යම් හානියක් එමගින් සිදුවේ.

**හොර්නර් (1957:286)**

"ශ්‍රේෂ්ඨ වූ ශ්‍රමණයකු මාගේ වන්දනාවට පත්ව බොහෝ කලකි. නමුත් මේ ශ්‍රමණයා මහවනයට පැමිණෙමින් සිටී. ඔබගේ ගාථාවකින් ඉගැන්වෙන ධර්මය අසා මම වහා අකුශලයෙන් බැහැර වෙමි."

මෙම පරිවර්තනය අංගුලිමාල සූත්‍රයේ සංදර්භයට වඩාත් සමීප බැවින් වඩාත් නිවැරදි එකක් ලෙස සැලකිය හැකි බව පෙන්වා දෙන ගොම්බ්‍රිච් (1997:147) තවත් පියවරක් ඉදිරියට යමින් එම ගාථාව පපංචසූදනියේ දැක්වෙන ආකාරය ගෙන මෙසේ පරිවර්තනය කරයි.

"ඉක්බිති සොරා මෙසේ සිතීය: මේ මහා සීහනාදයකි, සීහනාදයකි. මෙය මහමායාගේ පුත් වූත් අභිනිෂ්ක්‍රමණය කළවුන්ගේ ශ්‍රේෂ්ඨතමයා වූත්, සිද්ධාර්ථගේ මිස වෙන කිසිවෙකුගේවත් විය නොහැකිය. ඒකාන්තයෙන් (වත) මා සිතන්නේ තියුණු නෙත් ඇති බුදුරදුන් මා දැක ඇති බවයි. භගවතුන් වහන්සේ මෙහි පැමිණ ඇත්තේ මාහට උපකාර

02 MAY 2012

කරනු පිණිසයි." එම නිසා 'චිරස්සවත මෙ....' ආදි වශයෙන් ප්‍රකාශ කළේය. මෙහි 'මහිතෝ' එතුමන් දෙව් මිනිසුන් විසින් අවශ්‍ය සිව්පසයෙන් පිදුම් ලැබූ බවයි. 'පච්චවාදී' යනු ඔහු මේ වනයට පැමිණ බොහෝ කලකට පසු මා හට උපකාර කිරීමට පැමිණි (පටිපජ්ජි) බවයි. 'පහස්සං පාපං' යනු මම පාපය හැර දමමි යන්නයි. (ගොම්බ්‍රිච්, 1997:147)

ඉහත ගාථාවෙහි අන්තර්ගත 'මහෙසී, 'චීරස්සං', 'සමණෝ' යනාදිය පිළිබඳ පූර්ණ පරියේෂණයක නිරත ගොම්බ්‍රිච්ගේ නිගමනය වන්නේ 'මහේෂි' යන්න හෝ 'සමණෝ' යන්න මෙම සංදර්භය තුළ බුදුරදුන්ට භාවිත වූ බවට විශ්වාස කළ නොහැකි බවයි. 'මහේසි' වෙනුවට 'මහෙසො' ආදේශ කළ හැකි බවත් එමගින් මෙම ගැටළුව නිරාකරණය කරගත හැකි බවත් ඔහු ප්‍රකාශ කරයි.

ඒ අනුව 'මහේශ' යන සංස්කෘත පදය (පාලි 'මහෙසො') 'සිව' වෙනුවෙන් යොදන අනුනාමයකි. එම නිසා අංගුලිමාල යනු ප්‍රාථමික ශෛව භක්තිකයෙකු විය හැකිය. එම නිසා ගොම්බ්‍රිච්ට අනුව මෙම ගාථාව පරිවර්තනය විය යුත්තේ පහත පරිදිය.

*චිරං වතා මෙ මහිතෝ මහේසෝ*
*මහාවනං පාපුණි සච්චවාදී*
*සෝ' හං චජිස්සාමි සහස්ස පාපං*
*සුත්වාන ගාථං තව ධම්මසුත්තං*

'පොරොන්දුවක් ඉටු කිරීම සඳහා දිගුකලක් තිස්සේ මම ශිව වන්දනා කරමින් සිට ඇත්තෙමි. ඔබ සත්‍ය ප්‍රකාශ කරමින් වනයට පැමිණ ඇත. එනිසා මම මගේ දහසක් අපරාධ (පාප) හැර දමමි. සත්‍ය කුමක්දැයි උගන්වන ඔබගේ ගාථාව ම අසා ඇත්තෙමි.' (ගොම්බ්‍රිච්, 1997:154)



මෙම අර්ථකථනයට ගොම්බ්‍රිච් පැමිණ ඇත්තේ ගාථාවේ පාද වෙනස්කොට, අඟුල්මල් බුදුරදුන් හමුවීමේ සත්‍ය සිද්ධිය යථාර්ථවාදීව උපකල්පනය කිරීමෙන් ඉක්බිතිවය.

මෙම පාඨය හා එහි විවිධ අර්ථකථන උපුටා දක්වන ලද්දේ අංගුලිමාල සූත්‍රය අනුසාරයෙන් ප්‍රකටව ඇති විවිධ ගැටළුවල සංකීර්ණතාව ප්‍රකට කිරීම සඳහායි. එසේම බුදුරදුන් හා අංගුලිමාල හමුවීම යනු බුද්ධ චරිතය හා සම්බන්ධ අතිශය වැදගත් සිදුවීම්වලින් එකක් වන්නේ කෙසේද යන්න වඩාත් හොඳින් ප්‍රකට කිරීම සඳහාත්ය.

## 03. අංගුලිමාල සූත්‍රයේ විග්‍රහිත දාර්ශනික හා ආගමික විශ්ලේෂණයන්හි සුවිශේෂත්වය

අංගුලිමාල සූත්‍රය විවිධ කරුණු අතින් මතරම් වූ විසිතුරු වුවකි. එහි පවත්නා සුවිශේෂී කාරණා සරලත්වයේ සිට සංකීර්ණ දාර්ශනික විවරණයන් දක්වා විවිධ සංකල්ප ඔස්සේ විහිද යාම මෙහි ඇති සුවිශේෂත්වයයි.

01. කර්මය සහ සදාචාරය පිළිබඳ විප්ලවීය විග්‍රහය
02. නොමගට පත් පුද්ගලයකු නිවැරදිවීම පිළිබඳ පිළිවෙල ප්‍රකට වීම
03. භික්ෂුව යනු සමාජ සංවේදී චරිතයක් බව බුදුරදුන් පිළිගැනීම
04. පෞරුෂ පරිවර්තනය පිළිගැනීම සහ එය පිළිගැනීමට සමාජය සහ පුද්ගලයා යන දෙ අංශයම සූදානම් විය යුතු බව.

05. සත්‍ය ක්‍රියාව පිළිබඳ සූත්‍රානුගත විවරණයක් ප්‍රකට වීම

06. අවස්ථාවෝචිතව හා පුද්ගලයන්ට අනුරූපී වන ලෙස අර්ථවත් ක්‍රමවේද භාවිතයට බුදුරදුන් සතු වූ සත්‍යතාව ප්‍රකට වීම

## කර්මය සහ සදාචාරය පිළිබඳ විප්ලවීය විග්‍රහය

ඉහත සටහන් කරුණු සියල්ල එකසේ වැදගත් වුවත් වඩාත්ම අවධානයක් යොමුවිය යුත්තේ කර්මය සහ සදාචාරය පිළිබඳ බෞද්ධ ආකල්ප සමග මෙම සුවිශේෂී සිදුවීම සම්බන්ධ වන ආකාරය පිළිබඳවයි. සූත්‍ර හා අටුවා යන උභය විග්‍රහයන්ට අනුව අඟුල්මල් යනු කෲර මනුෂ්‍ය ඝාතකයෙකි. එසේද වුවත් බුදුරදුන්ගේ මාර්ගෝපදේශකත්වය, අංගුලිමාලගේ පූර්ව කෘත පුණ්‍ය මහිමය සහ වරද නිවදර කර ගැනීමේ අවශ්‍යතාව සහ ඒ සඳහා අවශ්‍ය කටුයතු සම්පාදනය කිරීම ආදී කරුණු මත ගෞතම බුදුන් ජීවමාන සමයේදීම විමුක්ති සාධනයට අඟුල්මල් සමත් වෙයි.[11]

මෙම සිදුවීම මගින් ඇතිකරනු ලබන ගැටළු කිහිපයකි. බෞද්ධ ඉගැන්වීම අනුව මනුෂ්‍ය ඝාතනය යනු සාපරාධී වූ අකුසල ප්‍රතිඵල ගෙන දෙන පාපකර්මයකි. එවන් පවිටු ක්‍රියා එකක් නොව ක්‍රියාදාමයක් අඟුල්මල් සිදු කරයි. එසේ වූවත් මෙලොවදීම විමුක්ති සාධනයට ද ඔහු වරම් ලබයි. බෞද්ධ සාහිත්‍යයට අනුව බුදුරදුන්ගේ ශරීරයේ පිටුපස කොඳු ඇටපෙළ ආශ්‍රිත ආබාධයන් ඇතිවූයේත් ලේ සෙලවීමකට උන්වහන්සේ මුහුණ දෙන්නේත් ඇතැම් සංසාරික පාපකර්මවල බලපෑමේ හේතුවෙනි. මුගලන් මහතෙරුන් සොරුන්ගේ පහරදීමට ලක්වන්නේත් අතීත කර්ම ඵලයන්ගේ ප්‍රබලත්වය හේතුකොට ගනිමිනි. දහස් ගණන් මිනිස් ඝාතන සිදු කළ පුද්ගලයකුගේ පාපකර්ම ඵලදීමට තිබූ අවස්ථාව මුළුමනින්ම ඡේදනයවීමක් මෙහිදී සිදුවී ඇත.

[11] බු.ජ.මු. 524



සැබැවින්ම බෞද්ධ කර්ම සංකල්පය අනුව මෙය මෙසේ සිදුවිය හැකිද? චේතනාව මුල් කොට ගෙන කර්ම බිහිවන බවත් ඒ අනුව කායිකව, වාචසිකව සිදුකරන ක්‍රියා කර්ම විපාක සඳහා හේතුවන බවත් මූලික දේශනයයි.[12] අඟුල්මල් මිනිසුන් නසන්නේ ද දැන දැනමය (මයාහි හත්තෙ, බහු සඤ්චිච්ච පාණා ජීවිතා වෝරෝපිතානි, බු.ජ.මු. 524). දැන දැන සිදුකළ පාපකර්ම සංස්කාරයෝ පුද්ගල විඤ්ඤාණය සමග එක්ව සංසාරිකව ක්‍රියාත්මකවීම කර්මය සම්බන්ධව ඇති සාමාන්‍ය සිද්ධාන්තයයි. අඟුල්මල් තෙරුන් විමුක්තිය පත්වීම තුළින් ප්‍රකට වන ප්‍රමුඛතම පණිවුඩය වන්නේ, කෙතරම් පාප කර්ම සිදුකළ ද ඒවායේ වරද වටහාගෙන නිවැරදිවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත හැකි බවත් එවිට ඒවායේ ශක්තිය හා බලය හීනවන බවත් ය. මෙම කාර්ය මෙතරම් සරල නම් විමුක්ති සාධනයේ අත්‍යවශ්‍ය සාධකයක් වන අනුපූර්ව ප්‍රතිපදාවේ අගය අප වටහා ගත යුත්තේ කෙසේද? මේ හැරුණු විට සමාජ අපචාර, දුරාචාර අසීමිතව සිදුකරන පුද්ගලයෙකුහට ඔහුගේ චර්යාව අංගුලිමාල චරිතය උපකාරි කරගෙන සාධාරණීයකරණය කළ හැකිය. පංචසීල ප්‍රතිපදාව ප්‍රමුඛ සීලය මෙම විවරණය සමග යම් ප්‍රශ්න කිරීමකට ලක් නොවේද? එවන් සීලමය ප්‍රඥප්තිවල වටිනාකම හුදු සමාජ ප්‍රඥප්තියක් ලෙස ලඝුකොට තැකීමක් මින් ගම්‍ය වෙයිද? සමාජ සදාචාරයට අදාළ ශික්ෂා පද සහ විමුක්ති සාධනය අතර සෘජු සබඳතාවක් නොමැතිද? ආදිය මෙහිලා අතිශය සංකීර්ණ ස්වරූපයක් ගනු ලබන ගැටළු වනු නිසැකය.

කර්ම සංකල්පය විවිධ හා විචිත්‍ර ලෙස බෞද්ධ ඉගැන්වීම් තුළ නිරූපිතය. කර්මය පිළිබඳ ඇතැම් අර්ථකථනවලට අනුව අංගුලිමාලගේ විමුක්ති සාධනය ගැටළුකාරි නොවේ. ඇතැම් නිර්වචන අනුව මෙම සිදුවීම් දෙක පරස්පර බව ප්‍රකට වෙයි.

[12] චේතනාහං භික්ඛවේ කම්මං වදාමි...
උපාලි සුත්ත වර්ණනා. මජ්ඣිම පණ්ණාසක (අට්ඨ කතා)
Chatta Sangayana CD

02 MAY 2012

කුක්කුරවතික සූත්‍රයේ විවරණය වන පරිදි කර්මය යම් ආකාරයක පුද්ගල නැඹුරුතාවක් (මූලාශ්‍රය ම.නි.) ලෙස ගතහොත් අඟුල්මල්ගේ විමුක්ති සාධනය ගැටළුකාරි නොවේ. අඟුල්මාල සම්බන්ධ සංදර්භයේ දී සිදු වී ඇත්තේ ඔහු පුරුදු වූ කායික - මානසික නැඹුරුතාවලින් ඉවත් වී නව නැඹුරුකම් පුහුණු කිරීමකි. කර්ම පුද්ගලයා පසු පස එන යම් ශක්ති විශේෂයක් නොවන බව යම් ප්‍රමානයකට මෙමගින් ගම්‍ය වේ. එහෙත් මෙහිදී මතුවන ගැටළුව වන්නේ කර්මය මෙම සංදර්භය තුළ සංසාරගාමි පුද්ගල නැඹුරුකම් ලෙස පැහැදිලි කෙරෙන බැවින් සැලකිය යුතු ආකාරයක බල හෝ ශක්ති විශේෂයක් ලෙස කර්මය අර්ථවත් වන බව පිළිගැනීමට සිදුවීමයි.

කර්මය පිළිබඳ තවත් අර්ථකථනයක් වන ප්‍රබල කර්ම තුළින් දුබල කර්මය යටපත්වීම යන්න මෙහිදී වැදගත් සංකල්පයකි. ලෝණඵල වග්ග උපමාවකට අනුව (සං.නි) ලුණු කැටයකට ලුණු රස නිපදවිය හැකි වන්නේ හෝ නොවන්නේ ඒවා යොදනු ලබන ජලයේ ප්‍රමාණයට සාපේක්ෂවයි. එකම ප්‍රමාණයේ ලුණු කැටයක් ජලය පිරි සාමාන්‍ය බඳුනකට, ළිඳකට, ගඟකට දැමූවිට එම ජලය ප්‍රමාණයට සාපේක්ෂව ලුණු කැටයේ ගුණ අඩු හෝ වැඩි වෙයි. අඟුල්මල් ජීවිත කාලයේ සිදුකළ සමස්ත පාපකර්ම යටපත් කිරීමට තරම් ප්‍රබල කුසල කර්මයක් ඔහු සිදු කළේද? සිදු කළේ නම් ඒ කුසල ක්‍රියාව කුමක් ද? යන්න හඳුනා ගැනීම මෙහිදී වැදගත්ය. සූත්‍රානුසාරයෙන් ප්‍රකට වන ආකාරයට අනුව අඟුල්මල් විසින් සිදුකරනු ලබන කුසල ක්‍රියාවන්නේ බුදුන් සරණ යාම, ප්‍රව්‍රජාවට පත්වීම හා ඊට අදාළ ප්‍රතිපත්ති සම්පූර්ණ කිරීම ආදියයි. අඟුල්මල් විසින් තාවකාලිකව වගා කර ගත් හෝ වගාකරගන්නට සිදු වූ චර්යාවෙහි වෙනසක් මෙහිදී සිදු වී ඇත. එසේ ද වුවත් දිගුකලක් තිස්සේ අඟුල්මල් සිදුකළ සියලු ක්‍රියාවල වගකීමෙන් ඔහුව නිදහස් කරවීමේ සක්‍යතාවයක් බුදුරදුන් සතු විය නොහැකිය. කෙනෙකුගේ කර්මය සම්බන්ධ වගකීමෙන් ඔහුව නිදහස් කිරීමට වෙනත් අයකුට මැදිහත් වීමට හැකි බව බුදු සමය තුළ අවකාශ හිමිවේ ද යන්න සැබැවින්ම



ගැටළුකාරිය. අඟුල්මල්ගේ පූර්ව පුණ්‍ය ශක්තිය බුදුරදුන් වටහාගත් බව සූත්‍රයේ ද ප්‍රකාශ වෙයි. මහා පාප කර්ම රැසක් යටපත් කිරීමට අඟුල්මල් යෙදූ උපක්‍රමය වන්නේ ඉහත සඳහන් කළ ක්‍රියාමාර්ග දෙක පමණි. ප්‍රව්‍රජාවට පත්ව, ප්‍රතිපත්තිවල නිරත වීම යනු මේ මොහොතෙහි නිවැරදි ආකාරයෙන් විමුක්ති සාධනයට අවශ්‍ය ක්‍රියාමාර්ගයක නිරත වීමයි. වර්තමාන චර්යාව නිවැරදි හා ශක්තිමත් කර ගැනීමෙන් අතීත කර්ම රැසක් යටපත් කිරීමේ සක්‍යතාව උදා වූවා විය හැකිය. එම නිසා අතීත කර්මවලට වඩා (ශක්තියක්, බලයක් ලෙස) වර්තමාන චර්යාව බලවත් බවත් එය වඩාත් ප්‍රබල බවත් මින් පෙන්වා දෙන තවත් වැදගත් කරුණකි.

අඟුල්මල්ගේ ක්ෂණික පරිවර්තනය සහ විමුක්ති සාධනය මගින් සදාචාරාත්මක ගැටළු ද මතු වෙයි. ත්‍රි ශික්ෂාවේ අනිවාර්ය අවශ්‍යතාවයක් වන්නේ ගිහි පැවදි උභය පක්ෂයම ස්වකීය භූමිකාවට අදාළ සීල ප්‍රතිපත්තින්හි නිරත වීමයි. එවන් ශික්ෂාකාමි ප්‍රතිපත්ති මගින් සීලමය ප්‍රතිපත්ති විෂයෙහි බුදු සමය දක්වන අවධාරණය අඟුල්මල් චරිතයේ ක්ෂණික පරිවර්තනය මගින් යම් අභියෝගයකට ලක්කෙරේ. ප්‍රතිපත්ති පූරණය හා විමුක්ති සාධනය අතර ආවශ්‍යක සබඳතාවක් තිබේද නැද්ද යන්න මෙහිදී මතුවන ගැටළුවකි. එවන් ආවශ්‍යක සබඳතාවක් තිබේ නම් අඟුල්මල්ගේ විමුක්ති සාධනය වාර්තා වන ආකාරයේ සරලවූත් හා පහසුවූත් එකක් නොවනු ඇත. එසේ නොවී සාමාන්‍ය සදාචාරය හා විමුක්ති සාධනය අතර අනිවාර්ය සබඳතාවක් නොමැති යැයි පිළිගන්නේ නම් ඉන් තවත් ගැටළු රැසක් නිර්මාණය කෙරෙන අතර ඒවා සංකීර්ණ ස්වරූපයක් ද ගනු ඇත. සමාජ සාමය, පුද්ගල සම්බන්ධතාවල නිරවුල්, පුද්ගල සහනය යන අරමුණුවලට පමණක් බෞද්ධ සමාජ සදාචාරය සීමාවෙයි නම් එම සදාචාරයට ඇත්තේ උපයෝගීතාමය හෙවත් උපකරණමය අර්ථයකි. එසේම සංසාරගාමිත්වය හා විමුක්ති සාධනය අතර සම්බන්ධතාව සදාචාරාත්මක චර්යාවන්ට සාපේක්ෂව ගොඩනැගෙන බව අපේක්ෂා කළ නොහැකිය. අප මෙම කරුණු සමග

එකඟ වුවහොත් එමගින් ප්‍රකාශිත තවත් අදහසක් වන්නේ සදාචාර ප්‍රවර්ධනය යනු ලෝකෝත්තර අරමුණකට වඩා ලෞකික සමාජ ප්‍රගතිය සමග සම්බන්ධ වූවක් වන බවයි. මෙය මෙලෙස පිළිගතහොත් සමාජ අරමුණු, ආකෘති වෙනස්වීම් අනුව පුද්ගල හා සමාජ සදාචාරය සහජීවනයේ නිර්ණායක ද වෙනස්වීම අවශ්‍යයෙන්ම පිළිගැනීමට බුදුසමයට සිදුවෙයි. මෙහි දී අප මතකයට නැගෙන වැදගත් කරුණක් වන්නේ දී.නි. අග්ගඤ්ඤ සූත්‍රයේ මේ හා සමාන විවරණයක් හමුවේ. ඒ අනුව ප්‍රකට වන්නේ 'ධම්ම - අධම්ම' පිළිබඳ සමජගත ආකල්පය කාලීනව වෙනස්කම්වලට භාජනය වන බවයි. එම විවරණයට අනුව සදාචාර සම්මුති යනු පුද්ගලයාගේ සමාජ සබඳතා සහ ජීවිත නිරවුල්භාවය කේන්ද්‍ර කොටගත් සමාජ සම්මුතියකි. සමාජ සංස්කරණයකි. එබැවින් ඉන් එහා ගිය පරම අගයක් සදාචාර නිර්ණායක වලට ආදේශ කළ නොහැකිය. ගැටුම් අවම කරගනිමින්, පුද්ගල අභිමතාර්ථ ඉටුකර ගැනීමේ උපකරණාත්මක අගයන් සහිතව සකස් කරගත් පද්ධතියක් ලෙසින් සදාචාරය හඳුනාගැනීම බෞද්ධ සදාචාර මූලධර්මවලට පටහැනි නොවන බව මින් ප්‍රකට වේ.

බුදුසමයේ දැක්වෙන කර්ම සිද්ධාන්තයේ විචිත්‍ර විවරණ කිහිපයක් සූත්‍ර කිහිපයකින්ම හමු වේ. එවන් විග්‍රහ අතර සංඛධම (සං.නි) අංගුලිමාල ප්‍රවෘත්තියට වඩාත් නිවැරදි පදනමක් සපයයි. සංඛධම[13] සූත්‍ර විවරණයට අනුව යම් පුද්ගයකු දීර්ඝ කාලයක් තිස්සේ කරනු ලබන ක්‍රියාවන් සඳහා විපාක දිමේදී ඒ සමස්ත කාලසීමාවම පාපකාරි යුගයක් ලෙස සැලකීම අර්ථවත් නොවේ. සත්ව ඝාතනයේ යෙදෙන මිනිසෙකුගේ සාමාන්‍ය දිනචරියාව ගතහොත් ඔහු සත්ව ඝාතනයේ නොයෙදෙන කාලසීමාව සාපේක්ෂව වැඩිය. ඒ නිසා යමක් බහුල වශයෙන් කළ පමණින් ඒ සියල්ලටම යමෙක් විපාක විඳිය යුතුය යන්න මෙම සූත්‍රයේ අන්තර්ගතයට ප්‍රතිවිරෝධීය. බුදුරදුන්ගේ ඉගැන්වීම වන්නේ යමක් වැරදි ක්‍රියාවක් බව

[13] සං.නි. සළායතන වග්ගය, බු.ජ.මු. 582



වටහා ගෙන, නුවණින් සලකා එම ක්‍රියාවෙන් ඉවත් වීම, බැහැර වීම සහ නව යහපත් ක්‍රියා පුරුදු කිරීම මගින් කෙනෙකුගේ පව් ප්‍රහාණය වන බවයි. එම පුද්ගලයා පූර්ව කර්ම ඉක්මවා යාමේ හැකියාව ලබා ගන්නා බවයි.[14] මෙම විග්‍රහය අඟුල්මල්ගේ චර්යාත්මක වෙනස සහ විමුක්ති සාධනය සමග ඍජුවම සම්බන්ධ වේ. පැරණි චර්යා, වෙනස් කොට නව චර්යා ආදේශ කිරීම ඉතා ප්‍රබල කර්මය වන බව මින් මැනවින් ප්‍රකට කරයි.

අඟුල්මල්ගේ විමුක්ති සාධනය මගින් හෙළිකරනු ලබන විප්ලවීය වූත් ප්‍රගතිශීලි වූත් තවත් කරුණු කිහිපයකි. ඉන් ප්‍රමුඛ වන්නේ ප්‍රමාදය වටහාගත් සැණින් ඉන් ඉවත් ව ඕනෑම මොහොතක සිට නිවැරදි චර්යා සකස් කරගෙන නිරවද්‍ය පුද්ගලයෙකු වීමට මිනිසාට ඇති අවස්ථාව බුදුසමය තුළ පිළිගනු ලැබීමයි. මිනිස් සක්‍යතා හඳුනාගැනීම සහ ඒවාට පුළුල් අගයක් පැවරීම මෙහිදී සිදු වී ඇත (යෝච පුබ්බේ පමජ්ජිත්වා - පච්ඡා සෝ නප්පමජ්ජති.... ම.නි. II, 526). පුද්ගල ජීවිත විෂයෙහි බලපාන ආනුභවික සේම අධිභෞතික (මෙහි අධිභෞතික යනු ඍජු ලෙස ප්‍රකෘති ඉන්ද්‍රියයන්ට ගෝචර නොවන යන අරුත් දීමට පමණක් යෙදේ) සංකල්ප පිළිබඳ කරනු ලබන විනිශ්චයක් ද මෙම ක්‍රියාදායම තුළ අන්තර්ගත වෙයි. යම් පුද්ගල චර්යාවක් සමාජයට හානිකර වූ විට ඔහුටත් සමාජයටත් විවිධ ප්‍රායෝගික ගැටළුවලට මුහුණපෑමට සිදුවීම ස්වභාවිකය. එසේ වූවත් අධිභෞතික සාධක (කර්මය ශක්තියක් ලෙස ක්‍රියාත්මක වීම මෙහිදී නිදසුනක් සේ ගත යුතුය.) මිනිස් පැවැත්ම විෂයෙහි සැලකිය යුතු බලපෑමක් කරන බව බුදුසමය නිරතුරුව පිළිගත් කරුණක් බව ද බැහැර කළ නොහැකිය. ඒ බව පැහැදිලි කරන නිදර්ශන ලෙස පුඤ්ඤ හා සංස්කාර ගෙනහැර දැක්විය හැකිය. එසේ වූවත් අඟුල්මල්ගේ විමුක්ති

[14] සෝ ඉති පටිසංඛාය තඤ්චේව පාණාතිපාතං පජහති ආයතිඤ්ච පාණාතිපාතා පටිවිරතො හෝති ඒවමේතස්ස පාපස්ස කම්මස්ස පාහානං හෝති. සමතික්කමෝ හෝති. බු.ජ.මු. 582

සාධනයෙන් ගම්‍ය කරන්නේ සැබෑ පරිවර්තනයක්, චර්යාමය වෙනසක් මගින් ඉහත සඳහන් කළ නොකළ සමස්ත අධිභෞතික ශක්ති පරාජය කිරීම හෝ සහමුලින්ම අවසන් කිරීම සිදුකළ හැකි බවයි.

මෙමගින් ප්‍රකට කරන දෙවන වැදගත් කරුණ වන්නේ යම් මිනිසකුගේ සමාජ චර්යාව තුළින් පමණක් ඔහු පිළිබඳ තීරණය කිරීමේ ඇති ගැටළුකාරීත්වයයි. මිනිසා යනු ඕනෑම විටෙක පරිවර්තනය වීමේ සක්‍යතාව සහිත වූවකු බැවින් විවෘත ආකල්පයක් ඔහු වෙත යොමු කිරීමේ අවශ්‍යතාව මෙම පරිවර්තනයෙන් ප්‍රකාශිතය. බුදුරදුන් කොසොල් රජුගෙන් විමසන්නේ අඟුල්මල් පැවිදිව සිටිනු දුටුවහොත් ඔහු කෙරෙහි දක්වන්නේ කුමන ආකල්පයක්ද? කුමනාකාරයේ සැලකිල්ලක් ද යනුවෙනි. බුදුරදුන් මෙහිදී ක්‍රියාකරන්නේ සමාජයට හානිකර නොවන ප්‍රයෝජනවත් චරිතයක් ලෙස අංගුලිමාලව නැවත සමාජගත කිරීමට අවශ්‍ය පියවරක් අනුගමනය කිරීමයි. රජු පිළිතුරු දෙමින් පවසන්නේ අංගුලිමාලයන් භික්ෂුවක් වුවහොත් ඔහුට අවශ්‍ය ප්‍රත්‍ය පහසුකම් සහ ගෞරවය යන සියල්ලම සපයා දෙන බවයි. අඟුල්මල් තෙරුන් කොසොල් රජුට දැක්වූ විට රජතුමා පෙර සඳහන් කළ පරිදිම පුදසත්කාර, පරිත්‍යාග කිරීමට සැරසුනත් අඟුල්මල් හිමි එය අනවශ්‍ය බව රජුට පවසයි. පරිණාමීය හා විපරිණාමීය යන උභය ලක්ෂණවලටම යටත්ව පරිවර්තනය වන මිනිසා පිළිබඳ නිශ්චිත නිර්ණායක තුළින් නිගමනවලට බැසගැනීමේ අපහසුතාව හා අප්‍රායෝගිකත්වය ද මෙමගින් මනාව ගම්‍ය කෙරේ.

තමන්ට වන දුක් ගැහැට විඳ දරාගැනීමට අප සමත් විය යුතු ආකාරය මෙමගින් දැක්වෙන තෙවෙනි ආදර්ශයයි. අඟුල්මල් හිමියන්ට සමාජයෙන් විඳින්නට සිදු වූ විවිධ අපහසුතා, හිංසා දුටු බුදුරදුන්ගේ පිළිතුර වූයේ මෙපමණ වූ අවම වේදනාවකින් සසර ආත්ම සිය දහස් ගණනක් විඳීමට නියමිත වූ කර්මයෙන් නිදහස් වීමට තමන් ලැබූ අවස්ථාව පිළිබඳ සිතා සහනයට පත්විය යුතු බවයි. ජීවන දුෂ්කරතා



විසඳාගත හැකි සීමාවෙන් ඔබ්බට ගිය විට එය සාධාරණීකරණය කරලීමක් මෙහිදී සිදු වෙයි.

යම් පුද්ගලයෙකු සතු සක්‍යතා ඔහුගේ තාවකාලික චර්යා මුල්කොටගෙන යටපත් නොවන බවත් එම සක්‍යතා නිසි පරිදි හඳුනා ගැනීමෙන් මිනිසා වඩාත් අර්ථවත් ජීවිතයකට යොමු කළ හැකි බවත් මෙම සූත්‍රයෙන් විග්‍රහ කෙරෙන සිව්වන කරුණයි. සං.නි. මහානාම වර්ගයට අයත් සරකාන සූත්‍රයත්, සංබධම සූත්‍රයත් ඉදිරිපත් කරන්නේ කර්මය පිළිබඳ මේ හා සමාන වූ විග්‍රහයකි.

කර්මය වඩාත් ප්‍රායෝගික තලයක් වෙත ගෙන ඒමට ඇති සක්‍යතාව අඟුල්මල් හිමියන්ගේ පරිවර්තනයෙන් ප්‍රකට කෙරෙයි. එය මෙම විග්‍රහයේ ඇති මීළඟට වැදගත් කරුණයි. අධිභෞතික කරුණු ඇසුරු කොට ඒවාට මිනිසාව යටත් කිරීම වෙනුවට අනුභූතික කරුණු වඩා අවධාරණය කිරීමටත් ඒවාට වැඩි ප්‍රමුඛත්වයක් ලබාදීමත් මෙහිදී සිදුවෙයි. මේ මොහොතේ ගනු ලබන තීරණ සහ ඒ සඳහා කැප වී සිය චර්යා, සකස් කර ගැනීම මිනිස් ජීවිත අභිවෘද්ධියේ ආවශ්‍යක සාධකයක් බව ද අවධාරණය වෙයි.

ඉහත කරුණු හැරුණු විට කැපී පෙනෙන තවත් විග්‍රහයක් අංගුලිමාල සූත්‍රයෙන් පෙන්වා දෙන්නේ භික්ෂුවක් සතු විය යුතු සමාජ සංවේදීත්වයේ ප්‍රමාණය සහ එහි වටිනාකමයි. ගර්භනී මාතාවක් දරු ප්‍රසූතියක දී විඳිනු ලබන වේදනාව දැනෙන්නේ පෘථග්ජන වූ අඟුල්මල් හිමියන්ටයි. මෙවන් හැඟීමක් ඇතිවීමත් සැබැවින්ම ආශ්චර්යමත් වූවකි. මෙතෙක් සිය මව හෝ ශ්‍රමණයකු කෙරෙහිවත් සංවේදී නොවූ ඔහු වේදනාවට පත් කාන්තාවක් නිසා සංවේදී භාවයට පත් වෙයි. ඇය කෙරෙහි කාරුණික සිතුවිලි පහළ වෙයි. සූත්‍ර විග්‍රහයට අනුව කෙටි කලක් තුළ ඔහු තුළ සිදු වූ වෙනස්කම් වන්නේ බුදුරදුන්ගේ ශ්‍රාවකයකු වීමත් එයට අදාළ සංස්කෘතියක කෙටි කලක් ජීවත් වීමත්ය.

එම කෙටි කාලසීමාව තුළ සිදු වූ පුහුණුව අංගුලිමාල තුළ යටපත්ව තිබූ කාරුණිකත්වය, මෘදු බව නැවත මතුවීමට, තියුණුවීමට හේතු වූවා විය හැකිය.

අවධානයට ලක්විය යුතු මෙයටම අදාළ මීළඟ කරුණ වන්නේ අඟුල්මල්ගේ සමාජ හිතකාමිත්ව පිළිබඳ බුදුරදුන් දැක් වූ සුහදශීලි සහ පොළඹවන සුළු ප්‍රතිචාරයයි. සමාජයක් නසන්නට ක්‍රියාකළ පුද්ගලයකු තුළ ඇති වූ හෝ සමාජ හිතකාමී සිතුවිල්ලක් නිවැරදි පරිදි මෙහෙයවා අර්ථවත් අරමුණක පිහිටුවීම බුදුරදුන්ගේ සුවිශේෂි ගුණයකි. අවශ්‍ය මෙහොතේ දී සැබෑ සමාජ සත්භාවයෙන් යුතුව සමාජ ගැටළුවකට මැදිහත් විමට භික්ෂුවකට ඇති යෝග්‍ය බවත් ඒ සඳහා අවස්ථාවට සාපේක්ෂව විකල්ප ක්‍රියා මාර්ග අනුගමනය කළ යුතු බවත් මෙමගින් තවදුරටත් ප්‍රකට වෙයි. මෙම ගුණාංගයේ උචිත බව වඩාත් පැහැදිලි වන්නේ වර්තමාන ලාංකේය භික්ෂුවගේ සමාජ චර්යාව සමග මෙය සැසඳීමේදීය. මවක විසින් විඳිනු ලබන ප්‍රසූති වේදනාවකට සංවේදී වන වර්තමාන භික්ෂුවට ඒ සඳහා මැදිහත් වීමේ (ආගමික) සිතුවිලි පහළ වුවහොත් ඊට ලැබෙන සමාජ ප්‍රතිචාර කෙබඳු ස්වරූපයක් ගනු ඇද්ද? යන්න වටහා ගැනීමෙන් බුදුරදුන්ගේ ක්‍රියාවේ අර්ථය වඩාත් වැඩි වනු නිසැකය. ධර්ම හා විනය කරුණුවලින් ප්‍රකට වන අර්ථයට වඩා එහි වාච්‍යාර්ථය අගය කොට සැලකීමට ලාංකේය භික්ෂු සම්ප්‍රදාය මගින් ගනු ලබන ඇතැම් ප්‍රයත්නයන්හි සැබෑ අරමුණු හා අර්ථය කුමක්ද යන්න වටහා ගැනීමට මෙම සිදුවීම උපයෝගී කරගත හැකිය.

සමාජ විරෝධී චර්යා, ප්‍රවණතා සහිත පුද්ගලයකු නිරවද්‍ය භාවයට ගෙන ඒම සඳහා ක්‍රියාකිරීමේදී සැලකිලිමත් වියයුතු කරුණු කිහිපයක් ද මෙහිදි පැහැදිලි වෙයි. සමාජ සංශෝධකයන් විසින් ස්වකීය සේවාව තුළ දී අවශ්‍ය පුද්ගලයන් වෙත, ස්ථාන වෙත නිරාමිසව ගමන් කිරීමටත් එහිදී අවශ්‍ය කැපවීම් කිරීමට සූදානම් වීමත් අත්‍යවශ්‍ය බව



ඉන් ප්‍රකට කරයි. ඒ ඒ පුද්ගලයාගේ ශක්‍යතා හඳුනා ගැනීම සහ ඊට අවශ්‍ය ක්‍රමවේද විවිධ වූවත් ඒ විවිධ ලක්ෂණ අදාළ පරිදි භාවිත කිරීමේ නිපුණතාව සමාජ හිතකාමී පුද්ගලයකු තුළ වගා කොට වර්ධනය කළ යුතු බවත් එහිදී අවධාරණය කෙරෙයි.

අංගුලිමාල චරිතයේ ඇති ප්‍රගතිශීලී ලක්ෂණ කිහිපයක් ද මෙහිදී වෙන් කොට හඳුනා ගත යුතුය. ජීවිතය නිරවද්‍ය කර ගැනීමට අවශ්‍ය පුද්ගලයකු තුළ තිබිය යුතු ගුණාංග අතර වෙනස්වීමට කැමති වීම, ඒ සඳහා යෝග්‍ය විකල්ප පිළිගැනීම, ඊට අදාළ චර්යා වගා කිරීම සහ ඒ ඔස්සේ ජීවන අරමුණු සාධනය කර ගැනීම ඒ අතර කැපී පෙනෙයි.

## <u>නිගමනය</u>

අංගුලිමාල චරිතය සහ ඔහුගේ විමුක්ති සාධනය ත්‍රිපිටක සාහිත්‍යයේ ප්‍රකට බොහෝ චරිතවලින් වෙනස් ස්වරූපයක් ගත්තකි. එසේම අගුල්මල්ගේ විමුක්ති සාක්ෂාත්කරණය මගින් මතුකරනු ලබන කර්මය හා සදාචාරය සම්බන්ධ ගැටළු කිහිපයකි. මේ හැරුණු විට කර්මය හා සදාචාරය නව දෘෂ්ටිකෝණයකින් අර්ථවත් කිරීමටත් ඒවා වඩාත් ප්‍රායෝගික තලයකට ගෙන ඒමටත් අංගුලිමාල සූත්‍රයෙන් ලැබෙන විග්‍රහය අතිශය වැදගත් කමකින් යුතුය.

## ආශ්‍රිත ග්‍රන්ථ

ම.නි. II, බුද්ධ ජයන්ති ග්‍රන්ථමාලා (නව සංස්කරණ) ධර්මචක්‍ර ළමා පදනම; බණ්ඩාරගම, 2006.

ථේරගාථා අට්ඨකථා, අරියඤාණ හිමි රේරුකාන සංස්. සී.ඒ. හේවාවිතාරණ, ත්‍රිපිටක මුද්‍රණාලය; කොළඹ, 1925.

සංයුක්ත නිකාය - 4, සළායතන වර්ගය, බුද්ධ ජයන්ති ග්‍රන්ථමාලා නව සංස්කරණ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය; නැදිමාල, 2005

Paramattha Dipani, PTS

Papanca Sudani, PTS

Chattha Sangayana CD

Gombrich, R.F. How Buddhism Began: The Conditioned Genesis of the Early Teaching. Manshiram Manoharlal Publishers Pvt. Ltd : Delhi. 1967.

Hornor, I.B.(tr.). The Middle Length Sayings II, Pali Text Society : London. 1957.

Ñayānamoli, Thera, ed. Phra Khaniplo. A Treasury of the Buddha's Discourses from the Maijhima - nikaya. Vol .1.